# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - නොවැම්බර් මාසය - 4 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.

M.A.R.P.කුමාරි - ර/රත්මලවත්ත මහා විද්‍යාලය

## හොඳ ගුණදම් පුරුදු වෙමු - 24 පාඩම

මව්පියන්ට නැමදුමයි
ගුරුවරුනට සැලකුමයි
දක්වත් හොඳ පොඩි ළමයි
ඉන් එක ළමයෙක් මමයි

අපි දැන් හොඳ ළමයි. අපි ගොඩක් ගුණධර්ම ඉගෙන ගත්තා.අපේ බුද්ධ ධර්මය විෂය යටතේ නේද ?
ඉතිං දුවේ පුතේ අපි ඉගෙන ගන්නවා කියන්නේ, පොත පත කියවන්න ලියන්න දන්නවා කියන එකට නෙවෙයි.
පුතාලා දන්නවද රෑ අහසේ තරු ගොඩක් පායනවා.ඒත් එළිය අඩුයි.ඒ වුණාට රන්තැටියක් වගේ පායන්නේ එක හදයි.ඒත් මුලු ලෝකෙටෙම එළිය දෙනවා.අපි හිතට ගන්න ඕන තරුවක් වගේ නොවී හදක් වගේ වෙන්න.

අපිට පුලුවන් එහෙම වෙන්න කොහොමද දන්නව ද මෙන්න මේ ටික කලොත්.

*දෙමාපියන්ට ගුරුවරුන්ට සැළකීම.
*ගෙදර වැඩ වලට උදව් කිරීම.
*දිනපතා බුද්ධ වන්දනාව සිදු කිරීම.
*කුරුල්ලන්ට කෑම දීම.
*වැඩිහිටියන්ට ගරු කිරීම.
*කැමැත්තෙන්ම යහපත් දේ කිරීම.
*බොරු කේළම් නොකියා සත්‍ය වචන කතා කිරීම.

පුතාලා එහෙනම් දවසකට කරන එක හොඳ වැඩක් පුතාලගේ හොඳ වැඩ පොතේ ලියමු.
ඊට අදාළ චිත්‍රයක් අඳිමු.

ඔන්න අමතක කරන්න එපා,හොඳ වැඩ පොත කියන්නේ,අපේ පිං පොත.ඔයාලා ඒ විදියට
හිටියොත් හොඳට හැදී
දෙවියොත් නමට වඳී.

මේ පාඩමට අදාළ වීඩියෝ පාඩම නැරඹීම සදහ youtube එකට ගොස් Renuka Kumari හොද ගුණදම් පුරුදු වෙමු ලෙස Type කරන්න.

**“හොදයි ආදරණීය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!”**